**34 වන පිටෙන්**

නොවන චරිත ගණනාවක් එයාගෙ පෑනෙන් මවලා දුන්නා. ඒ ගොඩ අතරින් කීපයක් තමයි, බිංදු, සූත්තර පුංචා, රසවතී, කුසුමලතා. කුසුමලතා මුලින් ම අප අතරට

ආවේ සරසවියි පත්තරෙන්. සිබිල් නැන්දා ළමයින්ට විතරක් නෙවෙයි, වැඩිහිටියටත් රස විඳින්න කතා ලිව්වා. 70 ගණන්වල සරසවියට ලිව්ව ඒ කතා පසුව පොතක් වුණා. කුසුමලතා පොතේ තියෙන කතා ළමයින්ටත් රස විඳින්න පුළුවන්. ළමයින්ට විතරක් නෙවෙයි, ඕනෑම වයසකටත් ඔට්ටුයි. මෙන්න ඒ පොතේ අලුත් ම මුද්‍රණයෙන්

කතාවක්.

සිබිල් නැන්දා අපට කිසිදාක අමතක නොවන චරිත ගණනාවක් එයාගෙ පෑනෙන් මවලා දුන්නා. ඒ ගොඩ අතරින් කීපයක් තමයි, බිංදු, සූත්තර පුංචා, රසවතී, කුසුමලතා. සිබිල් නැන්දා ළමයින්ට විතරක් නෙවෙයි, වැඩිහිටියටත් රස විඳින්න කතා ලිව්වා. කුසුමලතා පොත ඕනෑම වයසකටත් ඔට්ටුයි. හොයාගෙන කියවන්න.

කතන්දරයක් ඇසීමෙන් හෝ කියවීමෙන් දරුවන් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණ වන්නේ සිනහව සතුට හා විනෝදයයි. අපේ ජන සාහිත්‍යයේ එන සුප්‍රකට ලබු කිරිබත් කතාවේ නරියාගේ පස්ස පැත්තේ ගසා තිබූ පොල් මුඩිඩ හාවා ඇද්දේ නැත්නම් ඒ කතාවෙන්ම වැඩක් නැත. මහදැනමුත්තාටත්

ගෝල පිරිසටත් හත් දෙනා හරියට ගණන් කරගන්නට බැරිවූ අවස්ථාවේදී මගදී හමුවූ ගැමියාගෙන් කට්ටියටම පස්ස පැත්තවල් රත්වෙන්නට හොඳවායින් කෝටු පැර බැගින් නොවැදුනානම් ඒ කතාවෙන් ඇති වැඩක් නැත. ජන සාහිත්‍යයේ එන මේ ආකාරයේ අකරතැබ්බවලින් රස විඳීමට සහ ඒවාට

සිනහසීමට ළමයින් තුළ ඇති කැමැත්ත ළමා සාහිත්‍යයට අත්‍යවශ්‍ය බව සිබිල් වෙත්තසිංහ මහත්මිය කිසි දිනක අමතක නොකරන්නේ ඇය තවමත් ගිතොරින් ආ අවුරුදු පහේ කුඩා දැරිය නිසා විය හැක.

එදා මුත්තා නාන දවස, සෙනුරාදා, පාන්දරින්ම ටීචර් නෝනා වතුර හැළියක්

මිදුලෙ ළිප උප තියලා ගින්දර දැම්මා, ආත්තම්මා එතනින් හෙළවුණේ නෑ ළිප හදා හදා හිටියා. පැයකින් පමණ ළිපේ වතුර ගොදා ගොඳ ගාලා නැටුවා.

වතුර නටනවා දුවේල ආත්තම්මා ටීචර් නෝනාට කතා කරලා කිව්වා.

එහෙනං බෙරේ ගහමු ටීචර් නෝනා විහිළුවට කිව්වා.

බැලූං බෝලෙට හුළං පිරුණ වගේ පුංචාට අලුත් පණක් ඇවිත් මිදුලට පැන්නා. මුත්තා නාන්න ඊයේ හිටන් ලෑස්ති වෙන්නේ. නාන්න හදන කොට බෙරත් ගහයි ද හිතලා පුංචා බලා හිටියා.

වතුර නටනවා. බුද්දක එලියට පැන්නා. සූත්තර පුංචා උඩ පැන්නා. සිබිල් නැන්දාගේ ඔඩොක්කුවට වැටුනා.

මට නවකතා ටිකක් තියෙනවා ලියන්න. ඊළග ආත්මේ ලියන්න කතා ඉතුරු කරගන්න මට බැහැ. මම මේ ආත්මෙන් පස්සේ නිවන් දකින්න හිතනවා. සිතින් නම් කවරදාවත් මා වයස්ගත වී නැහැ. සිතින් නම් මා සැමදා ජීවත් වුණේ බොහෝ වැඩිහිටියන්ට නොතේරෙන සුන්දර ළමා සිහින ලෝකයක.

සූත්තර පුංචාගේ ආත්තම්මා බුද්දකට අත වැනුවා.

---

**39 වන පිටෙන්**

කපුටන්ට ආප්ප අරගෙන දීම" නම් ලිපිය නිසා කෝප වී ලංකාවේ පුරුද්දට ඕස්ට්‍රේලියාවේ ලේඛකයින්ට තර්ජනය කළ රාජපුරුෂයින් ගේ නිරුවත පසුව හෙළි වූ බව අපි දනිමු. ඔවුන් පමණක් නොව, විවිධ අවස්ථාවල විවිධ පටු අරමුණු සහිතව මාධ්‍ය සංදර්ශන පවත්වනවුන් ගේ ද, ලංකාවෙන් මෙහි පාත්වන සාහිත්‍යධරයන් යැයි කියා ගන්නා උදවියගේ ද, සිවුරු පොරවාගත් පුද්ගලයින් ගේ ද, සැබෑ ප්‍රතිබිම්බය හෙළි කිරීමට ඔහු ගේ ලිපිවලට හැකිවිය. ඔහුට වැරදුණු තැනක් වුණ නම්, ඒ ඕස්ට්‍රේලියානු මෑත දේශපාලන ඉතිහාසයේ එක් කඩඉමක් අරහයා "ලේතමාගමනය" නමින් ලියවුණු ලිපිය පමණක් බව මගේ අදහසයි.

ඩී බී කුරුප්පු හා මගේ සාහිත්‍යමය මිත්‍රත්වය ගැන සිතන විට මගේ සිතට දුකක් ඇතිවන එක් කාරණයක් ඇත. ඔහු මට එවූ වෙළුම් හතකින් යුතු "අර්බත් දරුවෝ" දීර්ඝ නවකතාව කියවීම ඇරඹීමට ම මට වසරක් පමණ කල් ගත විය. එය සහමුලින් ම කියවා අවසාන කිරීමට මට ඊටත් වඩා කාලයක් ගත විය. මා ඔහු ලියූ "දානයේ ආනිසංස" නම් වූ කෘතිය පිළිබඳව හැකි පමණින් විචාරයක් ලියූ අතර එය සන්නස ප්‍රවත්පතේ ම පළ වූ නමුත්, මේ අති දීර්ඝ "අර්බත් දරුවෝ" පිළිබඳව මට එසේ කිසිවක් කළ නොහැකි විය. පසුව, ඩී බී කුරුප්පු විසින් ම ලියන ලද ලේඛනයකින් මා දැන ගත් පරිදි, ඔහු තමන්ගේ ඒ ප්‍රශස්ත ම පරවර්තනයේ පිටපත් යවා ඇත්තේ ඕස්ට්‍රේලියාවේ සිට ලියන කියන අප කාගේත් සිහිනයක් වන සිංහල සාහිත්‍යය ලෝකයට විවර කිරීමේ ශක්‍යතාවය ඇතැයි ඔහු සිතන අයට ය. දිගු කලක් ගතවීත්, ඒ කිසිවෙකු අඩු වශයෙන් ඒ පොත් කියවූ බව හෝ සඳහන් නොකිරීම ඔහු ගේ කනස්සල්ලට හේතු වී තිබුණි. වහා දුරකථනයෙන් ඔහු ඇමතූ මම, කාලයක් ගත වුවද, තවත් තිදෙනෙකු ද, මා ද ඒ පොත් සියල්ලම කියවූ බව පවසා සිටියෙමි. පසුව, සිඩ්නි නගරයේ විකාශයවන මධුර සිංහල ගුවන් විදුලි වැඩ සටහනේ දී මා ඒ පොත් පිළිබඳව යම් හැඳින්වීමක් කළෙමි.
ඒ ගුවන් විදුලි හඬපටය සොයා ඔහුට තැපෑලෙන් යවන්නෙමි යැයි සිතා සිටිය ද, එය අවසානය දක්වාම කළ නොහැකි වීම, මා පෙර සඳහන් කළ දුකට කාරණයයි.

මේ ලිපියේ ඉහළින් ම මා, ඩී බී කුරුප්පු ලේඛකයා හඳුවා දී ඇත්තේ "කෙළින් මිනිසා" යනුවෙනි. ඒ ඔහු තමන් ලියූ සෑම මාතෘකාවක් ගැනම තම අවංක අදහස එක එල්ලේ පවසන්නට මැලි නොවූ අයෙකු බව මා නිරීක්ෂණය කර ඇති නිසා ය.
මේ සඳහා මා දුටු මෑත කාලීන උදාහරණයක් වන්නේ, මේ වසරේ මාර්තු මාසයේ දී මෙලොව හැර ගිය සේනාධීර පියසේන ජ්‍යෙෂ්ඨ ලේඛකයා පිළිබඳව " පහන" සඟරාවේ අප්‍රියෙල් කලාපයට ඩී බී කුරුප්පු ලියූ ලිපියේ අවසාන කොටසයි. "නොබෝ දා උත්සවාකාරයෙන් දොරට වැඩම වූ ආචාර්ය රනිල් වික්‍රමසිංහ ගේ චරිතාපදානය ගැන ඇසූ මට හිතුණේ එස් පියසේන වැනි වියතෙකු ගේ චරිත කතාව දේශපාලකයෙකු ගේ හෝ ආගමික නායකයෙකු හෝ කතාවට වඩා රටටත් ජනතාවටත් වැඩදායක නොවන්නේ ද යන අදහස ම ය. මා තුළ හටගත් ඒ කාංසාව දුරු කිරීමට සමත් සත්ක්‍රියාවක් පෙබරවාරියේ ශ්‍රී ලංකාවට ගිය "සිහ නද" සංස්කාරක විල්ෆ්‍රඩ් සිරිවර්ධන විසින් කියනු ලැබී ය.

මාධ්‍යවේදී දයා ලංකාපුර අල්ලාගෙන තමා පියසේන චරිතාපදානය සම්පාදනය කිරීමේ වගකීම ඔහුට පැවරීම ය ඒ. ඒ පොතේ පිටපත පියසේන මහතා මිය යාමට පෙර අනුමත කිරීම ද අපේ වාසනාවක් ම ය. ලක්ෂ්මන් වික්‍රමසිංහ පියතුමාගේ ඥාතිපුත්‍ර බෞද්ධ ලේඛක රනිල් වික්‍රමසිංහ ගැන ලියූ චරිත කතාවට ඇතුළත් නොවූ නම් දෙකක් ඇති බව මට කිව හැකි ය. "බටලන්ද" සහ "ගෝනවල සුනිල්" යන මේ දෙක ය. චරිත කතාවකින් පලක් ලද හැක්කේ හොඳ නොහොඳ දෙකම විග්‍රහයට ලක් කළහොත් පමණි."

අපේ ආදරණීය ලේඛක ඩී බී කුරුප්පු, කෙළින් මිනිහා, තමන් ගේ ජීවිත කතාව කොටස් කිහිපයකින් ලියා පළ කොට ඇති බව අපි දනිමු. මුලින් සකස් කළ අත්පිටපත් සැර වැඩිය කියා ඉවතට දමා අලුතෙන් ම ලියා තිබුණ ද, රනිල් වික්‍රමසිංහ ගේ පළ වූ චරිතාපදනය මත පදනම්ව, ඉදිරියේ දී පළ වීමට නියමිත සේනාධීර පියසේන ගේ චරිතාපදානය සඳහා අවවාදයක් ලෙස ඩී බී කුරුප්පු ලේඛකයා පවසා ඇති ඉහත සඳහන් ඒ වැදගත් කාරණය, එනම් චරිත කතා ලිවීමේ දී හොඳ නොහොඳ දෙකම එක සේ විග්‍රහ කළ යුතු බව සහ "බටලන්ද", " ගෝනවල සුනිල්" වැනි නම් සැඟවිය නොයුතු බව, තම ස්වයංචරිතාපදාන ගුන්ථකරණයේ දී ඔහු ම අනුගමනය කරන්නට ඇතැයි මම සිතමි.

ඔහු ගේ අතීත රචනා ශෛලියට කවදත් දැඩි කැමැත්තක් දැක් වූ මට, ඩීබී කුරුප්පු ගැන ලියවෙන මේ ලිපියට එසේ ඇතුළත් නොකර සිටිය නොයුතු නම් දෙකක් නොව එකක්වත් සිතා ගත නොහැකි වූ බව අවසාන වශයෙන් පවසමි.

**රසික සූරියආරච්චි**

**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com